**කරච්චි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 24 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තිබූ ගබඩා තොගවල වටිනාකම රු. 261,940 කින් අඩුවෙන් දක්වා තිබීමෙන් සභාවේ වාර්ෂික ලාභය මූල්‍ය ප්‍රකාශනවල රු. 261,940 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සභාවේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය බදු දීමෙන් ලැබියයුතු හිඟ බදු කුලි එකතුව රු. 54,700 ක මුදල මූල්‍ය ප්‍රාශනවල පෙන්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.3 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය | 405,009 | සේවය හැරගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් අයවියයුතු ආපදා ණය සහ උත්සව අත්තිකාරම් හිඟ මුදල පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 07 දක්වා අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි 502,507 | | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 852,217 | කල් ඉකුත්වූ තැන්පත් 29 ක් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිට අවශ්‍යා කටයුතු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 85,704,856 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 67,364,113 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 200,000 | - | - | - | 150,000 | - | | - |
| (ii) | කුලී | 32,180,000 | - | 39,038,907 | 3,903,276 | 33,958,960 | - | 33,096,769 | 3,280,826 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,406,000 | - | 6,646,677 | - | 6,019,700 | - | 5,705,812 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,032,870 | - | 35,125,894 | 31,952,585 | 25,150,400 | - | 44,610,207 | 30,445,168 |

**3 මෙහෙයුම් සමාලෝචිතය**

**----------------------------**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) සේවක මණ්ඩල පුරප්පාඩු සහ අතිරික්ත**

**-------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 114 කි. තථ්‍ය කාර්ය මණ්ඩලය 102 කි. සේවක මණ්ඩල පුරප්පාඩු 12 පිරවීමට කටයුතු නොකිරීමෙන් ඒ අයගෙන් ලබාගත හැකි වැඩ කටයුතුවලට බාධා සිදුවී ඇත. තවද, අතිරික්ත කාර්ය මණ්ඩලය 04 ක් විය.

**(ආ) සේවක ණය**

**--------------**

සේවය හැර ගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් අයවියයුතු හිඟ සේවක ණය එකතුව රු. 405,009 ක් වර්ෂ 01 සිට වර්ෂ 07 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 ප්‍රමාදවූ ව්‍යාපෘති**

**-----------------**

සමාලෝචිත වර්ෂයේදී මුළු එකතුව රු. 1,817,682 කට ඇස්තමේන්තු කර තිබූ ප්‍රාග්ධන වැඩ 06 ක් ක්‍රියාත්මක නොකර ණය හිමි ප්‍රතිපාදනය කර තිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-------------------------------------------**

**අයවැය පාලනය**

**--------------------**

අයවැය ගත ආදායම සහ තථ්‍ය ආදායම අතර රු. 200,000 සිට රු. 20,614,925 ක් දක්වා නොහොත් සියයට 100 සිට සීයට 198 දක්වා විචලනයක්ද ඇස්තමේන්තු ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 145,122 සිට රු. 9,199,465 ක් දක්වා නොහොත් සියයට 17 සිට සීයට 58 දක්වා විචලනයන්ද නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
|---|---|
| (අ) ගිණුම්කරණය | වරිපනම් බදු තක්සේරු පිළිබඳ තක්සේරු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) වත්කම් / දේපල | (i) නිශ්කාර්යව තිබූ වාහන 12 ප්‍රයෝජනට ගත හැකි තත්වයට පත්කිරීමට කටයුතු කර නොතිබීම. |
| | (ii) සභාව වෙත පවරා නොගත් වාහන 30 ක් පසුගිය වර්ෂ 05 සිට 10 දක්වා සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු කාර්‍ය මණ්ඩලය පිරවීම සඳහා කටයුතු නොකිරීම. |